## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2022

2025 - ජූලි

**BCOM E 4082** - සංස්ථාපිත ආචාරධර්ම සහ යහපාලනය

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරයි (04) කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක 01

අ). ආයතනික පාලනය යනු කුමක්ද? ආයතනික පාලනය තුල අධක්ෂක මණ්ඩලයේ භූමිකාව විස්තර කරන්න.

(ලකුණු 07 යි.)

ආ). විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ භූමිකාවන් වෙන්කර හඳුනා ගන්න

(ලකුණු 08 යි.)

ඇ). "ආයතනික පාලනය යනු ආයතනයක් තුළ ශක්තිමත් නීතිමය ක්‍රමවේදයක් සහිතව කටයුතු කිරීම සඳහා නිර්මාණය කරන ලද සවිස්තර පද්ධතියකි. වගවීමේ සංස්කෘතියක් ඇතිවීම සහ නිවැරදි විගණන ක්‍රමවේදයක් පැවැත්ම, ආයතනය තුළ විභාගයකට යටත් වන ව්‍යාපාර ක්‍රියාවලියක් ඇති කරමින් විශේෂ වටිනාකමක් ලබා දේ. වගවීම සහ විගණනය, ආයතනයක නීතිමය, සදාචාරාත්මක හා කාර්යක්ෂම පාලනයක් සඳහා මූලික පදනමක් වේ."

මෙම ප්‍රකාශය මත පදනම්ව, ආයතනික පාලනයේ වගවීමේ (Accountability) සහ විගණනයේ (Audit) වැදගත්කම විශ්ලේෂණාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි.)

**(මුළු ලකුණු 25යි.)**

ප්‍රශ්න අංක 02

අ). "නිදහස් වෙළඳපොල යනු, කුඩා හෝ රජයේ පාලනයකින් තොරව, සම්පත් බෙදාහැරීම සහ වෙළඳ ගනුදෙනු සැපයුම සහ ඉල්ලුම මත ක්‍රියාත්මක වන ආර්ථික පද්ධතියකි. මෙම පද්ධතිය තුළ පුද්ගලයන්ට සහ ව්‍යාපාරයන්ට ස්වෙච්ඡා තීරණ ගැනීමට හැකියාව පවතියි."

පහත සඳහන් සංකල්ප සමඟ නිදහස් වෙළඳපොළේ සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න:

i. ධනවාදය සහ මූල්‍ය වෙළෙඳපොල

(ලකුණු 05)

ii. ධනවාදය සහ පුද්ගල නිදහස

(ලකුණු 05)

ආ). නිදහස් වෙළඳපොල පද්ධතියක මූලිකාංග මොනවද?

(ලකුණු 07 යි.)

ඇ). නිෂ්පාදන ව්‍යාපාර වෙළඳ භාණ්ඩකරණයෙන් (Merchandising) වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න?

(ලකුණු 08 යි.)

**(මුළු ලකුණු 25යි.)**

ප්‍රශ්න අංක 03

අ). සිරිමල් මහතා වසර 10කට වැඩි කාලයක් පෞද්ගලික වෙළෙඳ සංවිධානයක වෘත්තීය ගණකාධිකාරියෙකු ලෙස කටයුතු කරයි. ඔහුගේ ආයතනය නව ව්‍යාපාරයක් සඳහා ගිණුම්කරණ උපදෙස් ලබා දීමේ වගකීම භාරගෙන ඇත. කෙසේ වෙතත් මෙම ව්‍යාපාරයේ කළමණාකාරීත්වය ඔහුගෙන් ඇතැම් මූල්‍ය තොරතුරු හිතාමතාම රඳවා තබා ගන්නා ලෙස ඉල්ලා ඇත. නමුත් ඒසේ කිරීම නීත්‍යානුකූලව ප්‍රශ්නකාරී නිසා සිරිමල් මහතා වෘත්තීය ආචාරධර්ම අනුව මෙයට විරුද්ධ වන අතර එය වෘත්තීය වගකීම්වලට අනුව නිවැරදි නොවන බව පවසයි.

මෙම සිද්ධි අධ්‍යයනය මත පදනම්ව, පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න:

අ). වෘත්තීය ආචාරධර්ම යනු මොනවාද? ඒවා වෘත්තියවේදීන්ට වැදගත් වන්නේ ඇයි?

(ලකුණු 08)

ආ). ගිණුම්කරණ වෘත්තියවේදීන් සඳහා පොදු භාවිතය සඳහා වන ආචාරධර්ම අවශ්‍යතා පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ). වෘත්තීය ගණකාධිකාරියෙකුට අවශ්‍ය මූලික මූලධර්ම නම් කර ඒවා ඔහුට වැදගත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 09)

**(මුළු ලකුණු 25යි.)**

**ප්‍රශ්න අංක 04**

අමිල මහතා වෘත්තීය ගණකාධිකාරියෙකු ලෙස වසර ගණනාවක් සේවය කරන අයෙකි. ඔහු විවිධ සේවාදායකයන් සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ කටයුතු නිරතුරුවම සිදුකරයි. නව සේවාදායකයෙකු වූ සන් බ්‍රයිට් ලිමිටඩ් (Sun Bright Ltd.) විසින් ඔහුට, මූල්‍ය වාර්තා වල සෙසු තරඟකාරී ව්‍යාපාරයන්ට වඩා වාසි ලෙස පෙන්වමින් තොරතුරු සකස් කරන ලෙස ඉල්ලීමක් කරයි. මේ අවස්ථාවේදී අමිල මහතා හට "ආත්මාර්ථ තර්ජන" (self-interest threats) සහ "ස්වයං සමාලෝචන තර්ජන" (self-review threats) මතුවෙයි. ඔහු ගණකාධිකාරියෙකු ලෙස තම වෘත්තීය ආචාරධර්ම පිළිපැදීම තහවුරු කරමින්, වෘත්තීයමය සත්‍යතාවය සහ ස්වාධීනත්වය රැක ගැනීමට තීරණය කරයි.

මෙම සිද්ධි අධ්‍යයනය මත පදනම්ව, පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න:

අ). වෘත්තීය ගණකාධිකාරියෙකුගේ මූලික මූලධර්ම පිළිපැදීම පුළුල් පරාසයක තත්ත්වයන් මගින් තර්ජනයට ලක් විය හැක. "ආත්මාර්ථ තර්ජන" සහ "ස්වයං සමාලෝචන තර්ජන" මූලික මූලධර්ම වලට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ). පිළිගත හැකි මට්ටමකට තර්ජන අඩු කිරීම හෝ තුරන් කිරීම සඳහා පහත ආරක්ෂණ ක්‍රම භාවිතා කළ හැකිය.

- වෘත්තිය, නීති සම්පාදනය හෝ නියාමනය මගින් නිර්දේශ කරන ලද ආරක්ෂාව
- සේවාදායකයා තුළ පවතින ආරක්ෂාව
- සමාගමේම පද්ධති සහ ක්‍රියා පටිපාටි තුළ ආරක්ෂාව

පිළිගත් මට්ටමකට තර්ජන අඩු කිරීමට මෙම ආරක්ෂණ ක්‍රම භාවිතා කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 25යි.)**